මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PRE/2024/100 2024.09.20

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

**රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු අයවළුන්ට, ඡන්ද විමසීම්වල දී වැටුප් හෝ පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවනු පිණිස නිවාඩු ලබාදීම.**

තම ඡන්දය දීමට හැකි වනු පිණිස සේවා නියුක්තීන්ට නිවාඩු දීමට සේවා යෝජකයන් කටයුතු කළ යුතු බවට 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනතේ 110 වැනි වගන්තියෙන් (2023 අංක 21 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියේ සංශෝධිත) විධිවිධාන සලසා ඇති අතර 2024.09.21 දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ දී ද එය නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුව ඇත.

මෙයට පෙර මේ සම්බන්ධයෙන් මාධ්‍ය මඟින් සියලුම සේවා යෝජකයින් දැනුවත් කර ඇතත් සමහර පෞද්ගලික ආයතනවල සේවකයන්ට නිවාඩු ලබාදීම නිසි පරිදි සිදු නොවන බවට මැතිවරණ කොමිෂන් සභාව වෙත පැමිණිලි ලැබී තිබේ.

ඒ අනුව මෙම ඡන්ද විමසීමේ දී රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල මෙන්ම පෞද්ගලික අංශයේ සේවයේ නියුතු (විශේෂයෙන්ම ඇඟලුම් කම්හල්, පෞද්ගලික වෙළඳ ව්‍යාපාර, කර්මාන්ත ශාලා , පෞද්ගලික ආයතන හා හෝටල් ක්ෂේත්‍රයේ ) අයට ස්වකීය ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවීම පිණිස ස්වකීය ආයතනයේ සේවා නියුක්තීන්ට ඡන්දය දීමට යෑමට හා ඊමට ප්‍රමාණවත් නිවාඩු ලබා දෙන ලෙස සියලුම සේවායෝජකයන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)

(+94)112868441-42-43 (+94)112868426 info@elections.gov.lk www.elections.gov.lk Election Commission of Sri Lanka SriLankaElectionCommission elecomsl